බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Department of Education - Western Province**

| 33 | S | I |
|---|---|---|

# අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය - 2024
## Support Test Paper for G.C.E (A/L) - 2024

ශ්‍රේණිය / Grade } 13 | විෂයය / Subject } ගිණුම්කරණය | පත්‍රය / Paper } I | පැය / Hours } පැය දෙකයි

වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ

- ❖ සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❖ අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
- ❖ අංක 31 සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ **තිත් ඉර මත ලියන්න.**
- ❖ සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු හිමි වේ.
- ❖ **විභාග අංකය** ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
- ❖ වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

***විභාග අංකය*** ……………………………

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

| **1 පත්‍රය සඳහා** | |
|---|---|
| **ප්‍රශ්න අංකය** | **ලකුණු** |
| 1 - 30 | |
| 31 - 50 | |
| **එකතුව** | |

1. ''වාර්තාකරණ ඒකකයක දැනට සිටින සහ අපේක්ෂිත ආයෝජකයන්ට, ණය සපයන්නන්ට සහ අනෙකුත් ණයහිමියන්ට එම ඒකකයට අදාළව සම්පත් සැපයීම සඳහා තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීම''
   (1) පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශනවල අරමුණයි.
   (2) කළමනාකරණ ගිණුම්කරණයේ මූලික අරමුණයි.
   (3) පොදු පරමාර්ථ මූල්‍ය වාර්තාකරණයේ අරමුණයි.
   (4) පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන සංරචකවල අරමුණයි.
   (5) මූල්‍ය ගිණුම්කරණයේ මූලික අරමුණයි. **(………)**

2. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව මූල්‍ය ප්‍රකාකශන මූලිකාංග මැනීමේ දී යොදාගත හැකි මිනුම්කරණ පදනමක් **නොවන්නේ** මින් කවරක් ද?
   (1) සාධාරණ අගය (2) ප්‍රවර්ථන පිරිවැය (3) ප්‍රයෝජ්‍ය අගය
   (4) පුරෝකථන අගය (5) ඉෂ්ඨ කිරීමේ අගය **(………)**

3. පහත සඳහන් එක් එක් ප්‍රකාශනයට වඩාත් අදාළ වන ගිණුම්කරණ සංකල්පය අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   A - දේපළ පිරියත හා උපකරණ එහි ඵලදායී ජීවකාලය පුරා ක්‍රමානුකූලව ලියා හැරීම.
   B - තොග තක්සේරුව සඳහා භාවිත කරන ලද පිරිවැය සූත්‍රය ගිණුම්කරණ සටහන් තුළ නිරූපණය කිරීම.
   C - වගකීම් සහතික සඳහා වාර්ෂික වියදම ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනා ගැනීම.

   (1) ගැලපුම් සංකල්පය, අනාවරණ සංකල්පය, ආරක්ෂණ සංකල්පය.
   (2) අඛණ්ඩ පැවැත්ම සංකල්පය, අනාවරණ සංකල්පය, ගැලපුම් සංකල්පය.
   (3) ගැලපුම් සංකල්පය, සංගතතා සංකල්පය, ආරක්ෂණ සංකල්පය.
   (4) අඛණ්ඩ පැවැත්ම සංකල්පය, සංගතතා සංකල්පය, ආරක්ෂණ සංකල්පය.
   (5) ගැලපුම් සංකල්පය, අනාවරණ සංකල්පය, ගැලපුම් සංකල්පය. **(………)**

❖ **ප්‍රශ්න අංක 4, 5 සහ 6 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු අදාළ කර ගන්න.**

යසසි එන්ටප්‍රයිසස් ආයතනය එකතු කළ අගය මත බදු අය කිරීම සඳහා ලියාපදිංචි ව්‍යාපාරයකි. ව්‍යාපාරයේ 2024 මාර්තු මස සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත වේ.

3/02 අත්පිට විකුණුම් රු.259 600 (18% VAT සහිතව) විකුණු තොගයේ පිරිවැය රු.180 000 කි.
3/08 පවනිගෙන් භාණ්ඩ ණයට ගැනුම් රු.120 000 කි. (18% VAT රහිතව)
3/18 පිරිවැය රු.20 000 ක් වූ (VAT රහිත අගය) පවනිගෙන් ගත් භාණ්ඩ තොගයක් ආපහු හරවා යැවීම.
3/26 පවනි ට ගෙවිය යුතු මුළු ණය පියවීමට රු.10 000 ක මුදල් වට්ටමක් අඩු කර චෙක්පතක් නිකුත් කිරීම.

[දෙවන පිටුව බලන්න.]

4. ඉහත එක් එක් ගනුදෙනු යසසි එන්ටප්‍රයිසස් ආයතනයේ පොත්වල සටහන් කිරීමේ අවසාන ශුද්ධ ප්‍රතිඵලය ගිණුම්කරණ සමීකරණයේ විචල්‍යයන් ඇසුරින් ඉදිරිපත් කළවිට නිවැරදි පිළිතුර වන්නේ,

රු.'000

| | වත්කම් | = | වගකීම් | + | හිමිකම් |
|---|---|---|---|---|---|
| (1) | + 79.6 | = | + 39.6 | + | + 40 |
| (2) | + 69.6 | = | + 19.6 | + | + 50 |
| (3) | + 86.0 | = | + 36.0 | + | + 50 |
| (4) | + 89.6 | = | + 49.6 | + | + 40 |
| (5) | + 89.6 | = | + 39.6 | + | + 50 |

(.........)

5. යසසි එන්ටප්‍රයිසස් සමඟ පවනි සිදු කළ ගනුදෙනු පවනිගේ ව්‍යාපාරයේ වාර්තා කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛන අනුපිළිවෙලින් දක්වෙන පිළිතුර වන්නේ,
(1) ගැනුම් ඉන්වොයිසිය, හරපත, මුදල් ගෙවීම් වවුචරය.
(2). ලදුපත, ගැනුම් ඉන්වොයිසිය, හරපත, ගෙවීම් වවුචරය.
(3) ලදුපත, විකුණුම් ඉන්වොයිසිය, බැරපත, ලදුපත.
(4) විකුණුම් ඉන්වොයිසිය, බැරපත, ලදුපත.
(5) විකුණුම් ඉන්වොයිසිය, හරපත, මුදල් ගෙවීම් වවුචරය. (.........)

6. 3/26 දින යසසි එන්ටප්‍රයිසස් විසින් පවනි ට ගෙවන ලද චෙක්පතෙහි වටිනාකම සහ 3 /31 දිනට ඉහත ගනුදෙනු නිසා ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම දක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

| | චෙක්පතෙහි වටිනාකම (රු.) | ගෙවිය යුතු VAT (රු.) |
|---|---|---|
| (1) | 111 600 | 21 600 |
| (2) | 108 000 | 21 600 |
| (3) | 131 600 | 21 600 |
| (4) | 108 000 | 18 000 |
| (5) | 118 000 | 18 000 |

(.........)

❖ **පහත තොරතුරු ප්‍රශ්න අංක 7 හා 8 පිළිතුරු සැපයීමට අදාළ වේ.**

- දිල්මිගේ ව්‍යාපාරය 2024.03.31 දිනට පිළියෙල කරන ලද කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවලින් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

| | රු.'000 |
|---|---|
| දළ ලාභය | 428 |
| ශුද්ධ ලාභය | 286 |

- ශේෂ පිරික්සුමේ ඇති වූ වෙනස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ට ඇතුළත් කර තිබුණි.
- ව්‍යාපාරයේ ගිණුම් තැබීම හා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ආධුනික ගිණුම් සහයක විසින් සිදුකර ඇති අතර, පසුව කළ පරීක්ෂණයක දී පහත වැරදි අනාවරණය විය.

1. අයිතිකරු විසින් තම උපන්දින සාදය සඳහා ව්‍යාපාරයෙන් ලබාගත් රු.38 000 මුදල සහ රු.24 000 ක භාණ්ඩ පිළිබඳ කිසිදු සටහනක් තබා නැත.
2. ලද පොලී ආදායම් රු.12 800 ක් පොලී ආදායම් ගිණුමට රු.18 200 ක් ලෙස බැර කර තිබීම.
3. 2024.03.31 දිනට භෞතික තොගය පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති අතර, මාර්තු මස ගැනුම්වලට අදාළ රු.8 000 ක මාර්ගස්ථ තොගය සැලකිල්ලට ගෙන නැත.
4. 2024 මාර්තු මස උපචිත විදුලි ගාස්තුව රු.16 400 ක් විදුලි ගාස්තු ගිණුමට දෙවරක් හර කර තිබුණි.
5. මාර්තු මස මුදල් ගෙවීම් ජ'නලයේ වට්ටම් තීරුවේ එකතුව වූ රු.6 300 වෙළඳ ගෙවිය යුතු දෑ පාලන ගිණුමට බැර කර ඇත.

7. ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර ශේෂ පිරික්සුමේ පැවති අඩුව / හිඟය වන්නේ,
(1) රු.9 200 (හර) (2) රු.4 700 (බැර) (3) රු.1 600 (හර)
(4) රු.4 700 (හර) (5) රු.11 700 (හර) (.........)

8. ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසු නිවැරදි දළ ලාභය හා ශුද්ධ ලාභය පිළිවෙලින් දක්වෙන පිළිතුර වන්නේ,

| | දළ ලාභය රු.'000 | ශුද්ධ ලාභය රු.'000 |
|---|---|---|
| (1) | 460 | 329 |
| (2) | 452 | 329 |
| (3) | 460 | 321 |
| (4) | 436 | 305 |
| (5) | 436 | 229 |

(.........)

9. සෙනුරි නිෂ්පාදන සමාගමේ 2024.03.31 දිනෙන් අවසන් පළමු කාර්තුව සඳහා පහත තොරතුරු ඔබට සපයා ඇත.

| | රු.'000 |
|---|---|
| අමුද්‍රව්‍ය ගැනුම් ………………………………………… | 1 700 |
| සෘජු වැටුප් ………………………………………………… | 1 400 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය …………………………… | 1 150 |
| තොග වැඩිවීම - අමුද්‍රව්‍ය ……………………………… | 200 |
| - නොනිමි ……………………………… | 50 |
| - නිමි ………………………………… | 420 |
| මුළු නිෂ්පාදන පිරිවැය ………………………………… | 4 500 |

2024.03.31 දිනෙන් අවසන් පළමු කාර්තුවේ සෘජු වෙනත් පිරිවැය කොපමණ ද?

(1) රු.450 000 (2) රු.700 000 (3) රු.550 000
(4) රු.500 000 (5) රු.650 000 (………)

10. 2024.03.31 දිනට සෙතුමිගේ ව්‍යාපාරයේ වෙළඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම හර ශේෂය රු.670 000 කි. එදිනට උප ලෙජරයේ වෙළඳ ලැබිය යුතු දෑ ශේෂ එකතුව මීට වෙනස් වූ අතර, පහත පසුව කරුණු අනාවරණය කරගෙන ඇත.

- දුන් වට්ටම් රු.24 000 පාලන ගිණුමෙහි සටහන් කර තිබුණේ රු.42 000 ක් ලෙස ය.
- ආපසු එවුම් ජ'නලය රු.3 200 ක් අඩුවෙන් එකතු කර තිබුණි.
- අගරු වූ තැන්පත් කළ රු.8 200 ක චෙක්පත පිළිබඳව උප ලෙජරයේ සටහනක් තබා නැත.
- වෙළඳ ලැබිය යුතු දෑ මත අය කළ පොලී රු.7 500 ක් පොදු ලෙජරයේ සටහන් කර නැත.

- ව්‍යාපාරය සෑම ගිණුම් වර්ෂයක් අවසානයේ දී ම වෙළඳ ලැබිය යුතු දෑ මත 5% ක හානිකරණ අලාභ සඳහා ඉඩහැරීමක් ගලපනු ලබයි.

2024.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු වෙළඳ ලැබිය යුතු දෑ වල ධාරණ අගය වන්නේ,

(1) රු.692 300 (2) රු.665 475 (3) රු.657 685
(4) රු.623 070 (5) රු.663 765 (………)

11. අකලංකගේ ව්‍යාපාරයේ 2024.03.31 දිනෙන් අවසන් වසර සඳහා පහත තොරතුරු ඔබට සපයා ඇත.

| | රු.'000 | |
|---|---|---|
| විකුණුම් ………………………………………… | 354 | (VAT සහිතව) |
| 2023.04.01 තොගය ……………………………… | 68 | |
| වර්ෂය තුළ තොග අඩු වීම ………………………… | 20 | |
| 2023.04.01 ගෙවිය යුතු VAT ………………………… | 102 | |
| 2024.03.01 ගෙවිය යුතු VAT ………………………… | 35 | |
| වර්ෂය තුළ මුදලින් ගෙවූ VAT ……………………… | 85 | |

- ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි වී ඇති අතර, VAT ප්‍රතිශතය 18% කි.

2024.03.31 දිනෙන් අවසන් වර්ෂයේ අකලංකගේ ව්‍යාපාරයේ ගැනුම් වටිනාකම සහ දළ ලාභය පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

| | ගැනුම් රු. | දළ ලාභය රු. |
|---|---|---|
| (1) | 400 000 | 80 000 |
| (2) | 200 000 | 98 000 |
| (3) | 200 000 | 80 000 |
| (4) | 200 000 | 100 000 |
| (5) | 236 000 | 80 000 |

(………)

12. පාලිත සමාගමේ 2024.03.31 දිනට ඉතිරි තොග සම්බන්ධව පහත තොරතුරු ඔබට සපයා ඇත.

| තොග කාණ්ඩය | අයිතමය | ඒකක ගණන | ඒකක පිරිවැය රු. | ඒකක ශුද්ධ උප ලබ්ධි අගය රු. |
|---|---|---|---|---|
| (1) | A | 250 | 18 | 20 |
| | B | 300 | 25 | 22 |
| (2) | P | 600 | 40 | 38 |
| | Q | 450 | 30 | 28 |

[හතර වන පිටුව බලන්න.]

LKAS - 02 (තොග) ප්‍රමිතයට අනුව කාණ්ඩ ක්‍රමයට අවසන් තොගය ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු වටිනාකම සහ අයිතම් ක්‍රමයට තොග ගණනය කරන්නේ නම් කපාහළ යුතු තොග වටිනාකම පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

| | **අවසන් තොගය රු.** | **තොග කපාහැරීම රු.** |
|---|---|---|
| (1) | 47 000 | 3 000 |
| (2) | 47 000 | 2 500 |
| (3) | 46 500 | 3 000 |
| (4) | 49 500 | 2 500 |
| (5) | 46 500 | 2 500 |

(.........)

13. එක්සත් ක්‍රීඩා සමාජයේ 2023.04.01 දිනට සමුච්චිත අරමුදල රු.3 500 000 ක් විය. එදිනට පැවති මුළු වගකීම් රු.1 250 000 කි.
2024.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී ''ක්‍රීඩාංගන නවීකරණ අරමුදල'' නමින් විශේෂ අරමුදලක් ආරම්භ කරන ලද අතර, වර්ෂය තුළ එම අරමුදලට ලද පරිත්‍යාග රු.500 000 කි.

2024.01.08 දින ක්‍රීඩාංගනය නවීකරණය කිරීම ආරම්භ කළ අතර, 2024.03.31 වන විට රු.500 000 නවීකරණ කටයුතු සඳහා වැය කොට ඇත. වර්ෂය තුළ දී ක්‍රීඩා සමාජයේ වත්කම්වල වැඩි වීම රු.1 500 000 ක් විය. 2024.03.31 දිනට වගකීම් රු.800 000 කි. 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා සමාජය උපයන ලද අතිරික්තය /ඌනතාවය කොපමණ ද?

(1) රු.5 450 000 (2) රු.1 950 000 (3) රු.1 250 000
(4) රු.1 450 000 (5) රු.1 050 000 (.........)

14. හවුල් ව්‍යාපාර ගිණුම්කරණයට අදාළ පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය /ප්‍රකාශන වන්නේ,

A - හවුල්කරුවකු විශ්‍රාම යන විට ඔහුගේ/ඇයගේ හිමිකම නිරවුල් කරන තෙක් 5% ක වාර්ෂික පොලියක් උපචිත කළයුතු බව 1890 හවුල් ආඥා පනතේ 24 වන වගන්තියෙන් නියම කර ඇත.

B - හවුල් ව්‍යාපාරයක් සඳහා හවුල්කරුවන් සපයන ණය සඳහා ගෙවන පොළිය ව්‍යාපාරයේ ලාභ විසර්ජනයක් ලෙස සලකනු ලබයි.

C - හවුල් ව්‍යාපාරයක අයිතිය වෙනස්වීමක දී කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුමින් පමණක් ගැලපූ විට හවුල්කරුවන්ගේ මුළු හිමිකමෙහි වෙනසක් සිදු නොවේ.

D - හවුල් ආඥා පනතට අනුව සෑමවිට ම හවුල්කරුවන් ලාභාලාභ සමානව භුක්ති විඳිය යුතු ය.

(1) A හා C නිවැරදි වේ. (2) A, C හා D නිවැරදි වේ. (3) C පමණක් නිවැරදි වේ.
(4) A හා D නිවැරදි වේ. (5) D පමණක් නිවැරදි වේ.

(.........)

❖ **ප්‍රශ්න අංක 15 හා 16 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ආසිරි, ජයසිරි සහ දයාසිරි පවත්වා ගෙන ගිය හවුල් ව්‍යාපාරයේ 2024.04.01 දිනට මුළු හිමිකම හා ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් පහත වේ.

| | **මුළු හිමිකම රු.'000** | **ප්‍රාග්ධන ගිණුම රු.'000** |
|---|---|---|
| ආසිරි | 8 500 | 7 000 |
| ජයසිරි | 7 000 | 6 000 |
| දයාසිරි | 5 000 | 5 500 |

- 2022.01.01 දින ජයසිරි විසින් රු.2 000 000 ක ණය මුදලක් ව්‍යාපාරයට සපයා තිබුණි.
- 2024.04.01 දින ජයසිරි ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කළ අතර, එදිනට කීර්තිනාමය රු.1 200 000 කට තක්සේරු කරන ලදී.
- ආසිරි, ජයසිරි සහ දයාසිරි අතර ලාභාලාභ බෙදා ගැනීමේ අනුපාතය පිළිවෙලින් 5 : 3 : 2 විය. ජයසිරි විශ්‍රාම ගැනීමෙන් පසු සමාන හවුල්කරුවන් ලෙස ව්‍යාපාරය දිගටම පවත්වා ගෙන යාමට ආසිරි සහ දයාසිරි එකඟ විය.
- ජයසිරිගේ හිමිකමෙන් රු.1 360 000 ක් 2024.04.01 දින දයාසිරි විසින් සිය පුද්ගලික මුදලින් ගෙවා දමන ලද අතර, එය දයාසිරිගේ ප්‍රාග්ධනයට එකතු කිරීමට හවුල්කරුවන් එකඟ විය. ජයසිරිගේ ඉතිරි හිමිකම ඔහුගේ ණය ගිණුමට මාරු කිරීමට ද ගිවිස ගන්නා ලදී.

15. 2024.04.01 සියලු ගැලපුම්වලට පසු ජයසිරිගේ ණය ගිණුමේ ශේෂය වන්නේ, රු.'000

(1) 8 000 (2) 6 000 (3) 9 360 (4) 7 000 (5) 4 700 (.........)

16. 2024.04.01 දින ජයසිරි විශ්‍රාම යාමෙන් පසු නව හවුල් ව්‍යාපාරයේ මුළු හිමිකම කොපමණ ද? රු.'000

(1) 15 500 (2) 15 000 (3) 14 500 (4) 13 140 (5) 12 140 (.........)

[පස් වන පිටුව බලන්න.]

17. LKAS - 02 (තොග) ප්‍රමිතයට අනුව තොග පිරිවැයට ඇතුළත් කළ **නොහැකි** අයිතමයන් ලෙස සැලකිය හැකි අයිතම ඇතුළත් පිළිතුර වන්නේ,

A - ගබඩා වියදම්    B - ගැනුම් මිල    C - අසාමාන්‍ය අපතයන්
D - ආනයන තීරු බදු    E - ආපසු අයකර ගත හැකි බදු

(1) A, C පමණි.  (2) A, C, D පමණි.  (1) C, E පමණි.  (4) A, C, E පමණි.  (5) B, D, E පමණි.

(.........)

❖ **ප්‍රශ්න අංක 18 සහ 19 ප්‍රශ්නවල ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු උපයෝගී කරගන්න.**

සීමිත උදාන පොදු සමාගමේ 2024.03.31 දිනෙන් අවසන් වසර සඳහා පහත තොරතුරු සපයා ඇත.

| | රු.'000 |
|---|---|
| විකුණුම් ………………………………………………… | 9 000 |
| දළ ලාභය ……………………………………………… | 5 400 |
| පරිපාලන වියදම් ……………………………………… | 600 |
| බෙදාහැරීමේ වියදම් ………………………………… | 450 |
| මූල්‍ය පිරිවැය ………………………………………… | 250 |
| යන්ත්‍ර විකුණුම් ලාභය ……………………………… | 400 |
| මෝටර් රථ ප්‍රත්‍යාගණන ඌනතාවය ………………… | 800 |
| ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අතිරික්තය ………………… | 1 000 |
| ගෙවූ ලාභාංශ ………………………………………… | 700 |

2024.03.31 දින මෝටර් රථ සහ ගොඩනැගිලි දෙවනවරට ප්‍රත්‍යාගණනය කරන ලදී. 2022.03.31 දින සිදුකළ පළමු ප්‍රත්‍යාගණනයේ දී ඇති වූ ප්‍රතිඵලයන් පහත වේ.

| | රු.'000 |
|---|---|
| මෝටර් රථ ප්‍රත්‍යාගණන අතිරික්තය | 1 600 |
| ගොඩනැගිලි ප්‍රත්‍යාගණන ඌනතාවය | 1 100 |

18. 2024.03.31 දිනෙන් අවසන් වසර සඳහා සමාගමේ මුළු ආදායම සහ මුළු වියදම දක්වෙන පිළිතුර වන්නේ,

| | **මුළු ආදායම රු.000** | **මුළු වියදම රු.000** |
|---|---|---|
| (1) | 10 400 | 5 100 |
| (2) | 10 200 | 4 900 |
| (3) | 11 000 | 5 700 |
| (4) | 10 200 | 4 900 |
| (5) | 10 400 | 5 700 |

(.........)

19. 2024.03.31 දිනෙන් අවසන් වසර සඳහා ලාභය සහ වෙනත් විස්තීරණ ආදායම දක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

| | **ලාභය රු.** | **වෙනත් විස්තීරණ ආදායම රු.** |
|---|---|---|
| (1) | 4 500 | 200 |
| (2) | 5 500 | 200 |
| (3) | 4 500 | (800) |
| (4) | 5 500 | (800) |
| (5) | 3 500 | (800) |

(.........)

20. LKAS - 07 (මුදල් ප්‍රවාහ ප්‍රකාශ) ප්‍රමිතයට අනුව පහත සඳහන් එක් එක් මුදල් ප්‍රවාහයන් ඇතුළත් කළයුතු ක්‍රියාකාරකම් අනුපිළිවෙලින් දක්වෙන පිළිතුර වන්නේ,

A - සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවූ ලාභාංශ.
B - ලද ලාභාංශ ආදායම.
C -. ගොඩනැගිලි නවීකරණ වියදම (නවීකරණය හේතුවෙන් ගොඩනැගිල්ලේ ඵලදායීජීව කාලය ඉහළ ගොස් ඇත.)
D -. බැංකු ණය ආපසු ගෙවීම.

(1) මෙහෙයුම්, ආයෝජන, මෙහෙයුම්, මූල්‍ය
(2) මූල්‍ය, ආයෝජන, ආයෝජන, මූල්‍ය
(3) මූල්‍ය, මෙහෙයුම්, ආයෝජන, මූල්‍ය
(4) මූල්‍ය, ආයෝජන, ආයෝජන, මෙහෙයුම්
(5) මූල්‍ය, ආයෝජන, මෙහෙයුම්, මෙහෙයුම්

(.........)

21. සීමිත රුවින්දි පොදු සමාගම 2024.01.01 දින නිෂ්පාදන යන්ත්‍රයක් අත් පත් කරගත් අතර ඊට අදාළව පහත තොරතුරු ඉදිරිපත් කර ඇත.

| | රු.'000 |
|---|---|
| ගැනුම් මිල (VAT සහිතව) ………………………………. | 1 672 |
| එකතු කළ අගය මත බදු ……………………………… | 72 |
| ආනයන තීරු බදු ………………………………… | 156 |
| නැව් ගාස්තු ……………………………………… | 44 |
| ආයතනය වෙත ප්‍රවාහන වියදම …………………… | 25 |
| වැඩබිම සකස් කිරීම ………………………………… | 15 |
| ස්ථාපන පිරිවැය ………………………………………… | 30 |
| සේවයකයන් පුහුණු කිරීම ……………………………… | 72 |
| මූලික පරීක්ෂණ පිරිවැය - ද්‍රව්‍ය හා ශ්‍රමය ……………… | 28 |
| - වෘත්තීය ගාස්තු …………… | 40 |
| මූලික පරීක්ෂණයේ නිෂ්පාදිත විකුණුම් ආදායම ………. | 64 |
| යන්ත්‍ර හා සම්බන්ධ පරිපාලන වියදම් ………………… | 36 |

- යන්ත්‍රයේ ඵලදායී ජීවකාලය වර්ෂ 12 ක් වන අතර, සුන්බුන් අගය රු.110 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.
- සමාගම එකතු කළ  අගය මත බදු (VAT) අය කිරීම සඳහා ලියාපදිංචි වී ඇති අතර. යන්ත්‍රය 2024.02.01 දින සිට භාවිත තත්ත්වයට පත් වී තිබුණි.

LKAS - 16 (දේපළ පිරියත හා උපකරණ) ප්‍රමිතයට අනුව යන්ත්‍රයේ මූලික හඳුනා ගැනීමේ පියවර සහ 2024.03.31 අවසන් වර්ෂය සඳහා හඳුනාගත යුතු ක්ෂය වියදම වන්නේ,

| | මූලික හඳුනා ගැනීමේ පිරිවැය රු.'000 | ක්ෂය වියදම රු. |
|---|---|---|
| (1) | 1918 | 40 |
| (2) | 1982 | 26 |
| (3) | 1910 | 25 |
| (4) | 1982 | 39 |
| (5) | 1910 | 37.5 |

(………)

22. සීමිත කවිඳු පොදු සමාගමේ 2023.04.01 දින මෝටර් රථවලට අදාළව පහත ශේෂයන් ඉදිරිපත් කර ඇත.

| | රු.'000 |
|---|---|
| මෝටර් රථ (පිරිවැය) | 12 800 |
| සමුච්චිත ක්ෂය | 3 600 |

2020.10.01 දින රු. 4 800 000  අත්පත් කර ගත් මෝටර් රථයක් ව්‍යාපාරය සතුවන අතර, එහි සුන් බුන් අගය රු.300 000 ක් ලෙසත්, ඵලදායී ජීව කාලය වසර 9 ක් බවත්, අත්පත් කරගත් දින ඇස්තමේන්තු කර තිබුණි. 2023.04.01 දින නැවත සිදු කළ සමාලෝචනයේ දී මෙම රථයේ ඉතිරි ඵලදායී ජීව කාලය වසර 5 ක් බවත්,  සුන්බුන් අගයෙහි වෙනසක් නොමැති බවත් ඇස්තමේන්තු කර ඇත.  ඉතිරි මෝටර් රථ පිරිවැය මත 10% බැගින් වාර්ෂිකව ක්ෂය කෙරේ.  තවද 2024.03.31 දින රු.3 200 000 ක් වටිනා නව මෝටර් රථයක් අත්පත් කර ගෙන ඇත.  2024.03.31 දිනෙන් අවසන් වසර සඳහා මෝටර් රථ ක්ෂය සහ 2024.03.31 දිනට මෝටර් රථ වල ධාරණ අගය වන්නේ,

| | වාර්ෂික ක්ෂය රු.'000 | 2024.03.31 දිනට ධාරණ අගය රු. |
|---|---|---|
| (1) | 1 250 | 11 350 |
| (2) | 1 450 | 14 550 |
| (3) | 1 450 | 10 950 |
| (4) | 1 450 | 7 750 |
| (5) | 650 | 1 1750 |

(………)

23. සීමිත තරින්දි පොදු සමාගමේ ගිණුම වර්ෂය 2024.03.31 දිනෙන් අවසන් වූ අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2024.06.08 දින අධ්‍යක්ෂවරු විසින් අනුමත කරන ලදී.  2024.03.31 සහ 2024.06.08 අතර කාලය තුළ සමාගමට අදාළව සිදුවූ සිද්ධීන් කිහිපයක් පහත දක්වේ.

A - 2024.03.02 දින සමාගමට විරුද්ධව සේවකයෙකු විසින් රු.850 000 ක වන්දියක් ඉල්ලා නඩුවක් පවරා තිබූ අතර එහි තීන්දුව 2024.05.10 දින ප්‍රකාශයට පත්කර රු.700 000 ක වන්දියක් සේවකයා ට ගෙවන ලෙස සමාගමට නියෝග කර ඇත.

B - 2024.03.31 දිනට වෙළඳ ලැබිය යුතු දෑ ශේෂය තුළ ඇතුලත් රු.45 000 ක ණය වටිනාකමක් ඇති ණයගැතියෙකු බුන්වත් වූ  බව 2024.06.20 දින අධිකරණය මගින් තීරණය කර ඇත.

[හත් වන පිටුව බලන්න.]

C - 2024.03.31 දිනට ගබඩාවේ තිබූ බඩු තොගයෙන් කොටසක් 2024.04.06 දින ඇති වූ ගින්නකින් සම්පූර්ණයෙන් විනාශයට පත් වී ඇත.

D - 2024.04.03 දින අත්පත් කරගත් රු.64 000 ක් වටිනා වෙළඳ බඩු තොගයක් 2024.05.13 දින රු.4 800 ක විකුණුම් වියදමක් දරා රු.62 000 කට අත්පිට විකුණා ඇත.

LKAS - 10 (වාර්තා කරන දිනට පසු සිදුවීම්) ප්‍රමිතයට අනුව ගලපන සිදුවීම් ලෙස සැලකිය හැක්කේ,

(1) A පමණි. (2) A හා D පමණි. (3) A, B හා D පමණි.
(4) A හා B පමණි. (5) A හා B පමණි. (.........)

24. LKAS - 37 (ප්‍රතිපාදනයන්, අසම්භව්‍ය වගකීම් සහ අසම්භව්‍ය වත්කම්) ප්‍රමිතයට අනුව සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශන ඇතුළත් නිවැරදි පිළිතුර වන්නේ,

A - විකුණුම්කරුවෙකු ගනුදෙනුකරුවෙකු වෙත ලබා දෙන වගකීම් සහතිකයක් මත ඇතිවන බැඳීම සම්මුතික බැඳීමකි.

B - අනාගතයේ දී ඇති විය හැකි මෙහෙයුම් අලාභයක් සඳහා ප්‍රතිපාදනයන් හඳුනාගත හැකිය.

C - වර්තමාන බැඳීමක් ඇතත් බැඳීමෙහි වටිනාකම විශ්වාසදායී ලෙස ඇස්තමේන්තු කළ නොහැකි විට එය වගකීමක් ලෙස හඳුනාගත නොහැක.

D - අසම්භව්‍ය වත්කමක් වුව ද ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමක් අපේක්ෂා කරන්නේ නම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වත්කමක් ලෙස හඳුනාගත හැකිය.

(1) A හා C පමණි. (2) A, B හා C පමණි. (3) A හා D පමණි.
(4) A පමණි. (5) C පමණි. (.........)

25. සීමිත අමාෂා පොදු සමාගමේ 2023.04.01 දිනට ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 200 000) රු.3 600 000 කි. එදිනට රඳවා ගත් ඉපැයුම් ගිණුමේ ශේෂය රු. 1 264 000 කි. 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය තුල දී හිමිකමට අදාළව සිදු වූ ගනුදෙනු පහත වේ.

1. 2023.07.01 දින එදිනට පැවති සෑම සාමාන්‍ය කොටස් 4 ක් සඳහා ම එක් කොටසක් බැගින් හිමි කරගත හැකි පරිදි හිමිකම් නිකුතුවක් සිදු කළ අතර, කොටසක ප්‍රතිශ්ඨාව රු.18 ක් විය. සියලු කොටස්හිමියන් නිකුතුව පිළිගෙන නිසි පරිදි මුදල් ගෙවීය.
2. 2023.10.01 දින සමාගමේ ඉඩම් ප්‍රථමවරට ප්‍රත්‍යාගණන කර රු. 1 200 000 ක අතිරික්තයක් හඳුනාගෙන ඇත.
3. 2023.12.31 දිනට මුදලින් ගෙවූ අතුරු ලාභාංශ රු.600 000 කි. 2023/2024 වර්ෂය සඳහා සමාගමේ මුළු විස්තීරණ ආදායම රු. 3 650 000 කි.
4. 2024.03.31 දින එදිනට සිටි සෑම සාමාන්‍ය කොටස් පහක් හිමි අයෙකුට එක බැගින් හිමිවන ලෙස කොටසකට රු.20 ක ප්‍රතිශ්ඨාවකට රඳවාගත් ඉපයුම් ප්‍රාග්ධනිත කරන ලදී.
5. වර්ෂයේ ලාභයෙන් රු.450 000 ක් පොදු සංචිතයට මාරු කිරීමට 2024.03.31 දින අධ්‍යක්ෂවරු තීරණය කරන ලදී.

ඉහත එක් එක් ගනුදෙනු නිසා සමාගමේ මුදල් ශේෂයේ සිදු වූ ශුද්ධ වෙනස සහ 2024.03.31 දිනට මුළු හිමිකම නිරූපණය කරන පිළිතුර වන්නේ,

| | මුදල් ශේෂයේ වෙනස රු.'000 | 2024.03.31 දිනට හිමිකම රු.'000 |
|---|---|---|
| (1) | + 300 | 9814 |
| (2) | - 600 | 8814 |
| (3) | +300 | 9364 |
| (4) | + 300 | 8814 |
| (5) | + 900 | 9814 |

(.........)

26. සීමිත දිලිනි පොදු සමාගමේ 2024.03.31 දිනෙන් අවසන් වසර සඳහා පහත තොරතුරු ඔබට සපයා ඇත.

| | රු.'000 |
|---|---|
| විකුණුම් ................................................. | 7 500 |
| 2023.04.01 දිනට තොගය. .................................. | 760 |
| 2024.03.31 දිනට තොගය.................................... | 440 |
| මෙහෙයුම් වියදම් .......................................... | 1 000 |
| වෙනත් ආදායම් ............................................. | 400 |

- 2023/2024 වර්ෂය සඳහා ගණනය කර ඇති සාමාන්‍ය තොග රැඳවුම් කාලය දින 40 කි.
- වර්ෂයකට ගනුදෙනු කරන දින ගණන 360 ක් ලෙස සලකන්න.

2023/2024 වර්ෂය සඳහා සමාගමේ දළ ලාභය සහ ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) රු.5 400 000, 25% (2) රු.2 100 000, 20% (3) රු.2 500 000, 20%
(4) රු.3 540 000 28.5% (5) රු.1 500 000, 25% (.........)

27. හෂිනි නිෂ්පාදන ආයතනයෙ 2025 ජනවාරි මාසය සඳහා පහත පිරිවැය ඇස්තමේන්තු සකස් කර ඇත.

- අපේක්ෂිත නිෂ්පාදනය ඒකක 4 800 කි.
- ඒකකයක නිෂ්පාදන පිරිවැය රු. 150 කි.
- මුළු යන්ත්‍ර පැය ගණන (මාසය සඳහා) 9 600 කි.

ආයතනයේ මුළු නිෂ්පාදන පිරිවැයෙන් 60% ක් ප්‍රාථමික පිරිවැය වන අතර, යන්ත්‍ර පැය පදනම මත පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කෙරේ.

එක් ඒකකයක් සඳහා අන්තර්ග්‍රහණය කළයුතු පොදුකාර්ය පිරිවැය වන්නේ,

(1) රු.30 (2) රු.72 (3) රු.60 (4) රු.45 (5) රු.90 (.........)

28. පිරිවැය - පරිමා - ලාභ විශ්ලේෂණයට අදාළව පහත ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

A - සමච්ඡේදන ලක්ෂ්‍යය ඉක්මවා ඇති මුළු දායකය උපයා ඇති ලාභයට සමාන වේ.

B - ඒකකයක විකුණුම් මිල අඩුවීම නිසා සමච්ඡේදන ලක්ෂ්‍යය පහළ යයි.

C - ලාභ පරිමා අනුපාතය /දායක විකුණුම් අනුපාතය වැඩි වීම සමච්ඡේදන ලක්ෂ්‍යයේ වටිනාකම අඩු වීමට හේතු වේ.

D - ස්ථාවර පිරිවැයට මුළු ලාභය එකතු කළ විට එය මුළු විකුණුම් ආදායමට සමාන වේ.

ඉහත එක් එක් ප්‍රකාශයට අදාළ අනෙකුත් සියලු සාධක ස්ථාවරව පවතී යැයි සලකා කුමන ප්‍රකාශ නිවැරදි වන්නේ යැයි සැලකිය හැකි ද?

(1) A, B හා C පමණි. (2) A, C හා D පමණි. (3) B හා D පමණි.

(4) B, C හා D පමණි. (5) A හා C පමණි. (.........)

29 ආයතනයක සත්‍ය විකුණුම් ඒකක ගණන රු. 8 000 කි. ඒකකයක විකුණුම් මිල රු.400 ක් වන අතර, මුළු ස්ථාවර පිරිවැය රු.960 000 කි.

වර්තමාන විකුණුම් මත උපයන ලාභය ර. 320 000 ක් නම් ඒකකයක විචල්‍ය පිරිවැය සහ සමච්ඡේදන ඒකක ගණන වන්නේ,

| | ඒකකයක විචල්‍ය පිරිවැය (රු) | සමච්ඡේද ලක්ෂ්‍යය (ඒකක) |
|---|---|---|
| (1) | 240 | 6 000 |
| (2) | 160 | 6 000 |
| (3) | 240 | 2 000 |
| (4) | 260 | 6 000 |
| (5) | 240 | 4 000 |

(.........)

30. සිමිත සැලෝම් පොදු සමාගම බිස්කට් නිෂ්පාදන සමාගමක් වන අතර, වෙළඳපොල ප්‍රසාරණය කර ගැනීමේ අරමුණින් නව නිෂ්පාදන යන්ත්‍රයක් මිලට ගැනීමට සලකා බලමින් සිටී. ඊට අදාළව පහත තොරතුරු ඔබට සපයා ඇත.

| | | රු.'000 |
|---|---|---|
| යන්ත්‍රයේ ගැනුම් මිල | | 6 000 |
| සුන්බුන් අගය | | 1 000 |
| බදු පසු ලාභය වර්ෂය : | | |
| | 1 | 500 |
| | 2 | 1 500 |
| | 3 | 1 000 |
| | 4 | 2 000 |
| | 5 | 2 000 |

මෙම ආයෝජනයේ පිළිගෙවුම් කාලය හා ආයෝජන ප්‍රතිලාභ අනුපාතය දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

| | පිළිගෙවුම් කාලය | ආයෝජන ප්‍රතිලාභ අනුපාතය % |
|---|---|---|
| (1) | අවු 03 මාස 06 | 68 |
| (2) | අවු. 03 | 40 |
| (3) | අවු. 04 මාස 06 | 68.5 |
| (4) | අවු 03 | 68 |
| (5) | අවු 04 මාස 06 | 40 |

(.........)

31. මූල්‍ය ප්‍රකාශන සංකල්පනාත්මක රාමුවට අනුව පහත සඳහන් එක් එක් ප්‍රකාශ **සත්‍ය (T)** ද **අසත්‍ය (F)** ද යන්න සඳහන් කරන්න.

**සත්‍ය /අසත්‍ය**

A - තොරතුරු තීරණ ගැනීමට සුදුසු වීමට නම් අදාළ බව සහ විශ්වාසනීය නියෝජනය යන මූලික ගති ලක්ෂණ තිබීම අනිවාර්යය වේ. ……………

B - තොරතුරු අදාළ බවින් යුක්ත වීමට නම් තොරතුරු සම්පූර්ණ සහ මධ්‍යස්ථ විය යුතු අතර වැරදි වලින් තොර විය යුතුය. ……………

C - වැඩි දියුණු කිරීමේ ගති ලක්ෂණ වන්නේ සංසන්දනාත්මක බව, කාලීන බව, සත්‍යාපනය කළ හැකි බව හා තේරුම්ගත හැකි බව වේ. ……………

D - තොරතුරු විශ්වාසවන්ත නියෝජනය කිරීමට නම් තොරතුරුවල පුරෝකථන අගය සහ ප්‍රති-පෝෂණ අගය හෝ එම ගුණාංග දෙකම ඇති විට ය. ……………

32. පහත දැක්වෙන ගනුදෙනු හා සිද්ධීන් නිසා වත්කම්, වගකීම්, හා හිමිකම් වලට අත්වන එක් එක් බලපෑම වැඩි වීම (+) හෝ අඩු වීම (-) වටිනාකම සමඟ දක්වන්න.

රු.'000

| | වත්කම් | = වගකීම් | + හිමිකම් |
|---|---|---|---|
| A - පිරිවැය රු.500 000 ක භාණ්ඩ රු.944 000 කට අත්පිට විකිණීම. මෙම වටිනාකම තුළ 18% ක VAT අඩංගු වේ. | …………… | …………… | …………… |
| B - වෙළඳ ලැබිය යුතු දෑ වලින් ලද චෙක්පත අගරු වීම රු.900 000 දුන් වට්ටම 10% කි. | …………… | …………… | …………… |
| C - පිරිවැය රු.250 000 ක් වූ භාණ්ඩ ආපසු එවුම් එහි විකුණුම් මිල රු.472 000 ක් වේ. මෙම වටිනාකම තුළ 18% ක VAT අඩංගු වේ. | …………… | …………… | …………… |
| D - බැංකු ණය වාරිකය ගෙවීම රු.300 000 කි. මෙහි අඩංගු පොලිය රු. 60 000 කි. | …………… | …………… | …………… |

33. 2024 අගෝස්තු මාසයට අදාළ බැංකු ගනුදෙනු වලින් පහත තොරතුරු හඳුනාගත හැක.

| | රු.'000 |
|---|---|
| අගෝස්තු මාසයේ මුදල් තැන්පතු ……………………………… | 1 800 |
| අගෝස්තු මාසයේ මුදල් ගෙවීම් ……………………………… | 1 700 |
| අගෝස්තු මාසයේ නිශ්කාශණය වූ චෙක්පත් ……………………………… | 1 610 |
| නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් ……………………………… | 150 |
| වෙළඳ ලැබිය යුතු දෑ ප්‍රේෂණ ……………………………… | 80 |
| ස්ථාවර නියෝග මත කළ බැංකු ණය වාරික මෙහි අඩංගු පොලිය රු. 10 000) ………… | 40 |
| 2024.08.31 දිනට බැංකු ප්‍රකාශයේ අයිරා ශේෂය ……………………………… | 200 |

පහත දෑ ගණනය කරන්න.

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු මුදල් ශේෂය (රු.'000) ……………………………………………

(ආ) 2024.08.01 දිනට මුදල් ශේෂය (රු.'000) ……………………………………………

34. සීමිත පොදු සමාගමක් විසින් 2023.04.01 දින භාවිත අයිතිය සඳහා යන්ත්‍රයක් අත්පත් කර ගැනීම සඳහා කල්බදු සමාගමක් සමඟ ගිවිසුමකට එළඹෙන ලදී. කල්බදු කාලය වසර 03 කි. 2023.04.01 දින මූලික ගෙවීම ලෙස රු.1 000 000 ක් ගෙවන ලදී. යන්ත්‍රය සවි කිරීම සඳහා රු.400 000 ක් සමාගම විසින් දරණ ලදී. 2024.03.31 දිනෙන් ආරම්භ වී වාර්ෂික වාරිකයක් රු. 500 000 බැගින් වාරික 03 කින් ගෙවිය යුතුය. ගම්‍ය පොලී අනුපාතය 10% ක් වන අතර,එම පොලී අනුපාතය යටතේ වට්ටම් සාධක පහත දැක්වේ.

| වර්ෂය | 01 | 02 | 03 |
|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.9 | 0.8 | 0.7 |

ඉහත තොරතුරු අනුව SLFRS 16 කල්බදු ප්‍රමිතයට,

(අ) 2023.04.01 දිනට කල්බදු වගකීම රු.'000. ……………………………………

(ආ) 2023.04.01 දිනට භාවිත අයිතියේ මුල් වරට හඳුනා ගැනීමේ පිරිවැය (රු.'000) ……………………

35. වඩාත් උචිත ගිණුම්කරණ සංකල්පය භාවිත කරමින් පහත වගන්ති සම්පූර්ණ කරන්න.

A - ව්‍යාපාර ආයතනයක් දේපළ පිරියත හා උපකරණ ක්ෂය වීම් සිදු කිරීමට පදනම සපයනු ලබන්නේ …………………………… සංකල්පය මඟිනි.

B - ව්‍යාපාර ආයතනයක් විසින් තොග අගය කිරීම සඳහා භාවිත කරන බරිත සාමාන්‍ය මිල ක්‍රමය වෙනස් නොකර පවත්වා ගෙන යාමට අදාළ වන්නේ, …………………………… සංකල්පයට අනුකූල වන බැවිනි.

C - භාවිත අයිතිය ඇති වත්කම් හා සම්මුති බැඳීම් ගිණුම් පොත්වල සටහන් කිරීමට ………………………. සංකල්පය අදාළ වේ.

D - වෙළඳ ගිවිසුමකට අදාළව ලැබූ මුදල් ලද අවස්ථාවේ අයභාරය ලෙස හඳුනා ගැනීම නිසා ……………………. සංකල්පය කඩ වේ.

36. සීමිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළව පහත සමීකරණ/වගන්ති සම්පූර්ණ කරන්න.

A - දේපළ පිරියත හා උපකරණ + ............................ + ජංගම වත්කම් = හිමිකම් + වගකීම් .

B - වත්කම් = ප්‍රකාශිත ප්‍රාග්ධනය + ............................ + ජංගම නොවන වගකීම් + ජංගම වගකීම් .

C- ජංගම වත්කම් = තොග + වෙළඳ ලැබිය යුතු දෑ + ............................ + මුදල් හා මුදලට සමාන දෑ

A - මුළු ආදායම - මුළු වියදම = .........................

37. දිලෙන තරු ක්‍රීඩා සමාජයේ 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

| | රු. |
|---|---|
| 2024.03.31 දිනට කලින් ලද සාමාජික මුදල් | 60 000 |
| 2024.03.31 දිනට හිඟ හිටි සාමාජික මුදල් | 70 000 |
| 2023.04.01 දිනට හිඟ හිටි සාමාජික මුදල් | 40 000 |
| 2023.04.01 දිනට කලින් ලද සාමාජික මුදල් | 30 000 |

2024.03.31 දිනෙන් අවසන වර්ෂය සඳහා වර්ෂයට අදාළ සාමාජික මුදල් රු. 1 500 000 කි. පෙර වර්ෂයේ කපාහළ සාමාජික මුදල් ලැබීම රු. 20 000 ක් වන අතර, පෙර වර්ෂයේ නොලද සාමාජික මුදල් කපා හැරීම රු.10 000 කි. වාර්ෂික මෙහෙයුම් වියදම් රු. 700 000 කි. අනිකුත් ආදායම ලෙස හඳුනා ගැනීම රු.100 000 කි.
ඉහත තොරතුරු අනුව,

(අ) මුදලින් ලද සාමාජික මුදල් (රු.'000) ………………………….

(ආ) අතිරික්තය හෝ ඌනතාවය (රු.'000) ………………………………………………….

38. හවුල් ව්‍යාපාර ගිණුම්කරණයට අදාළ පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය (T)** ද **අසත්‍ය (F)** ද යන්න සඳහන් කරන්න.

| | | **සත්‍ය/අසත්‍ය** |
|---|---|---|
| A - | සෑමවිටම 1890 හවුල් ආඥා පනතේ 24 වන වගන්තිය අනුව ලාභ අලාභ සම සමව බෙදාගත යුතුය. | …………… |
| B - | හවුල්කරුවෙකු විශ්‍රාම ගැනීමේ දී 1890 හවුල් ආඥා පනතේ 44 වන වගන්තියට අනුව ගෙවිය යුතු මුදල් ණයක් ලෙස රඳවා ගනු ලබයි නම් 5% පොලියක් ගෙවිය යුතුය. | …………… |
| C - | හවුල් ව්‍යාපාරයක ලාභ අලාභ බෙදා ගැනීම ප්‍රාග්ධන අනුපාතය අනුව සිදු කරන විට ප්‍රාග්ධන පොලී ගෙවීම අර්ථ ශූන්‍ය වේ. | …………… |
| D - | හවුල් ව්‍යාපාරයේ අයිතියේ වෙනසක් සිදුවන සෑම අවස්ථාවකදීම වත්කම් ගිණුම්ගත කළ යුතු ය. | …………… |

39. ඉසුරි, හිරුණි සහ දෙව්මි හවුල් ව්‍යාපාරයේ 2023.04.01 දිනට ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම් පහත වේ.

| | **ඉසුරි** | **හිරුණි** | **රු.000**<br>**දෙව්මි** |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | 1000 | 1 000 | 800 |
| ජංගම ගිණුම් | (200) | 100 | 200 |

2023.04.01 දින ඉසුරි හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. එදින රු. 300 000 ක ලිබඩු තොගයක් පවරා ගැනීමට ඉඩ හැරි අතර මුදලින් රු.100 000 ක් ද ගෙවන ලදී. ගෙවිය යුතු ඉතිරි ශේෂය රු.800 000 ක් ණය ගිණුමට මාරු කරන ලදී.

(අ) 2023.04.01 දිනට ව්‍යාපාරයේ මුළු කීර්තිනාමය (රු.'000) ……………………………………………

(ආ) කීර්ති නාමය ගිණුම්ගත කිරීමට අදාළ ජ'නල් සටහන් .

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

40. 2024.03.31 දිනට අවසන් වර්ෂය සඳහා සීමිත ජගත් සමාගම පහත තොරතුරු සපයා ඇත.

| | රු.000 |
|---|---|
| විකුණුම් …………………………………………………… | 8 000 |
| විකුණුම් පිරිවැය …………………………………………… | 5 500 |
| බදු පසු ලාභය ……………………………………………… | 1 000 |
| ලාභාංශ ගෙවීම ……………………………………………… | 300 |

සාමාන්‍ය කොටස් ගණන 200 000 කි.

ඉහත තොරතුරු අනුව,

(අ) දළ ලාභ අනුපාතය …………………… (ආ) ශුද්ධ ලාභ අනුපාතය ……………………

(ඉ) කොටසක ලාභාංශ …………………… (ඊ) කොටසක ඉපැයුම ……………………

(41) LKAS 8 (ප්‍රතිපත්ති , ඇස්තමේන්තු හා වැරදි) ප්‍රමිතයට අනුව පහත ප්‍රකාශ **සත්‍ය (T) ද, අසත්‍ය (F) ද** යන්න දක්වන්න.

| | | **සත්‍ය /අසත්‍ය** |
|---|---|---|
| A - | ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කළහැකි වන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයක් ඉල්ලා ඇති විටක දී හෝ අදාළ වෙනස් කිරීම මඟින් පවත්නා මූල්‍ය තත්ත්වයට, මුදල් ප්‍රවාහයට කාර්ය සාධකයට වඩා හොඳ තත්වයක් නිරූපණය කළ හැකි නම් පමණි. | …………… |
| B - | ව්‍යාපාර කටයුතුවල පවත්නා අවිනිශ්චිතභාවය නිසාම මූල්‍ය ප්‍රකාශනවල බොහෝ අයිතම නිශ්චිතව මැනීම අපහසු වන අතර, ඒ සඳහා ඇස්තමේන්තු භාවිත කරනු ලැබේ. | …………… |
| C - | ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම සැමවිටම අතීතානුයෝගීව ගැලපිය යුතුය. | …………… |
| D - | ඇස්තමේන්තු වෙනස්වීම වර්තමාන හා අනාගතයට බල පැවැත්වෙන පරිදි ගැලපිය යුතුය. | …………… |

(42) සමාගමක් විසින් අලෙවි කරනු ලබන භාණ්ඩයකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| **දිනය** | **විස්තරය** | **ප්‍රමාණය** | **ඒකක පිරිවැය / විකුණුම් මිල (රු)** |
|---|---|---|---|
| 2024.08.01 | ශේෂය | 2 000 | 10 |
| 2024.08.08 | ගැනුම් | 5 000 | 15 |
| 2024.08.15 | ගැනුම් | 3 000 | 20 |
| 2024.08.20 | විකුණුම් | 8 000 | 30 |

පහත දක්වා ඇති එක් එක් මිල ක්‍රමය යටතේ පහත දෑ ගණනය කරන්න.

| **මිල කිරීමේ ක්‍රමය** | **2024.08 මස සඳහා දළ ලාභය** | **2024.08.31 දිනට අවසන් තොගය** |
|---|---|---|
| ප්‍රථම ලැබීම ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය (FIFO) | ………………………… | ………………………… |
| භරිත සාමාන්‍ය මිල ක්‍රමය (WAC) | ………………………… | ………………………… |

43. සීමිත පවනි සමාගම 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු අදාළ වේ.

| | | **රු.'000** |
|---|---|---|
| | **2024.03.31** | **2023.03.31** |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් | 10 000 | 8 000 |
| ප්‍රත්‍යාගණන සංචිත | 1 500 | 1 000 |
| පොදු සංචිත | 400 | 300 |
| රඳවාගත් ඉපැයුම් | 1 900 | 800 |

2023/2024 වර්ෂය සඳහා ලාභාංශ ගෙවීම රු.400 000 කි. රඳවාගත් ඉපැයුම භාවිත කරමින් සංචිත ප්‍රාග්ධනිත කිරීම රු.500 000 කි. නව කොටස් නිකුතුවක් ද සිදුකර ඇත. වාර්ෂික ආදායම් බදු වියදම රු.800 000 කි.

ඉහත තොරතුරුවලට අනුව,

(අ) 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාලච්ඡේද ලාභය (රු.000) ……………………………………

(ආ) නව කොටස් නිකුත් කිරීම ප්‍රාග්ධනිත කිරීමට අදාළ ජ'නල් සටහන්.

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

44. සීමිත අරුණී සමාගම මාසයට අලෙවි කිරීම ඒකක 3 000 කි. තොග ඒකකයක මිල රු.80 කි. තොග පවත්වා ගෙන යාමේ පිරිවැය ගැනුම් මිලෙන් 10% කි. ආර්ථික ඇණවුම් ප්‍රමාණය ඒකක 300 කි.
ඉහත තොරතුරු අනුව,

(අ) එක් ඇණවුමක් සඳහා පිරිවැය ……………………………………………………

(ආ) මුළු ඇණවුම් පිරිවැය ……………………………………………………

45. නිෂ්පාදන සහ අලෙවි ව්‍යාපාරයකට අදාළ තොරතුරු පහත දැක්වේ.

- ඒකකයකට අදාළ පිරිවැය තොරතුරු

| | |
|---|---|
| සෘජු ද්‍රව්‍ය | 100 |
| සෘජු ශ්‍රමය | 80 |
| සෘජු වෙනත් පිරිවැය | 20 |
| විචල්‍ය - නිෂ්පාදන පොදුකාර්ය | 60 |
| නිෂ්පාදන නොවන පොදුකාර්ය | 40 |

- මුළු ස්ථාවර පිරිවැය රු.500 000 කි. මින් 60% ක් නිෂ්පාදන පොදුකාර්ය වේ.

ඒකක 20 000 දී පහත දෑ ගණනය කරන්න.

(අ) මුළු නිෂ්පාදන පිරිවැය රු. ………………… (ආ) මුළු පිරිවැය රු. ………………….

(ඉ) මුළු විචල්‍ය පිරිවැය රු. ………………… (ඊ) මුළු පොදුකාර්ය පිරිවැය රු. …………………

46. නිෂ්පාදන ව්‍යාපාරයක් A නමැති භාණ්ඩය නිෂ්පාදනය කරයි. ඒ සඳහා භාවිත කරන Q අමුද්‍රව්‍ය අයිතමයට අදාළ තොරතුරු පහත වේ.

- මසකට පරිභෝජනය අවම - ඒකක 1 000 උපරිම - ඒකක 3 000
- පොරොත්තු කාලය අවම - සති 04 උපරිම - සති 8
- ආර්ථික ඇණවුම් ප්‍රමාණය ඒකක 8 000

ඉහත තොරතුරු අනුව,

(අ) යළි ඇණවුම් මට්ටම ඒකක …………………… (ආ) අවම තොග මට්ටම ඒකක …………………

(ඉ) උපරිම තොග මට්ටම ඒකක …………………..

47. 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන සමාගමක් වන සීමිත අරලිය සහල් සමාගමේ වැටුප් ලේඛනයෙහි පහත තොරතුරු උපුටා ගෙන ඇත.

**වැටුප් ලේඛනය** රු.000

| සේවකයන් | ඉපයීම් | | | | දළ වැටුප | අඩු කිරීම් EPF සේවක | ශුද්ධ වැටුප | EPF | ETF |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මූලික වැටුප | දිරිදීමනා | අතිකාල | ප්‍රසාද දීමනා | | | | | |
| නිෂ්පාදන සේවකයන් | 400 | 150 | - | 20 | 570 | 40 | 530 | 60 | 12 |
| සුපරීක්ෂක සේවකයන් | 200 | - | 80 | 10 | 290 | 20 | 270 | 30 | 06 |
| එකතුව | **600** | **150** | **80** | **30** | **860** | **60** | **800** | **90** | **18** |

- දිරිදීමනා ගෙවීම නිම කරන ලද විශේෂිත ඇණවුමක් සඳහා කැලි පදනම මත ද ප්‍රසාද දීමනා සමාගමේ ලාභ මත පදනම්ව ද ගණනය කර ඇත.

ඉහත තොරතුරු අනුව,

(අ) සෘජු වේතන රු.'000 ……………………………………………………

(ආ) නිෂ්පාදන පොදුකාර්ය පිරිවැයේ අන්තර්ගත වැටුප රු.'000 ……………………………………………………

48. සීමිත මන්දනී සමාගම වායුසමීකරණ යන්ත්‍ර අලෙවි කොට සවි කිරීමේ නිරත වෙයි. යන්ත්‍රයක මිල රු.1 000 000 වන අතර සවි කිරීමේ ගාස්තු රු.200 000 කි. 2023.10.01 අමල් ව්‍යාපාරය විසින් යන්ත්‍ර සඳහා රු.5 500 000 ක් සමාගමට මුදලින් ගෙවන ලදී. 2024.03.01 වන විට සියලු යන්ත්‍ර අමල් ව්‍යාපාරයට ප්‍රවාහනය කරන ලදී. 2024.03.31 දිනට යන්ත්‍ර 03 සවිකර අවසන් කරන ලදී.

SLFR 15 - (ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් වලින් අයභාරය) ප්‍රමිතියට අනුව පහත දෑ හඳුනා ගන්න.

(අ) 2024 මන්දනී සමාගම විසින් හඳුනාගත් අයභාරය. රු.'000 ………………………………………………

(ආ) 2024.03.31 දිනට නොඉපැයූ ආදායම රු.'000 ……………………………………………………………

49. තනි භාණ්ඩයක් නිෂ්පාදනය කර අලෙවි කරන සමාගමක තොරතුරු පහත වේ.

| නිෂ්පාදන ඒකක | මුළු පිරිවැය |
|---|---|
| 2 000 | 55 000 |
| 3 000 | 75 000 |

දායක විකුණුම් අනුපාතය 60% කි.

පහත දෑ හඳුනා ගන්න,

(ආ) ඒකක විචල්‍ය පිරිවැය රු. ……………………… (ආ) ඒකකයක විකුණුම් මිල රු. ………………

(ඉ) ලාභ සමච්ඡේදන ලක්ෂ්‍යය ඒකක ………………

50. මුද්‍රණ ආයතනයක් නව යන්ත්‍රයක් මිල දී ගැනීමට සැලසුම් කරමින් සිටී. නව යන්ත්‍රයේ ගැනුම් මිල රු.1 000 000 වන අතර සවි කිරීමේ පිරිවැය රු.200 000 ක් වේ. පවතින කාරක ප්‍රාග්ධනය රු.200 000 සිට රු.500 000 දක්වා වැඩි වේ. පැරණි මුද්‍රණ යන්ත්‍රය රු.500 000 කට අලෙවි කිරීමට හැකි වේ. ඵලදායී ජීව කාලය වසර 04 කි. වාර්ෂික ශුද්ධ මුදල් ප්‍රවාහය වැඩි වීම රු.400 000 කි. නව යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය අවසානයේ විකිණිය හැකි මිල රු.300 000 කි.

මෙම ව්‍යාපෘතියේ පහත දෑ ගණනය කරන්න.

(අ) මූලික ආයෝජනය. රු'000 . ………………………………….

(ආ) පිළිගෙවුම් කාලය වසර ………………………………..

(ඉ) 4 වන වසරේ ශුද්ධ මුදල් ප්‍රවාහය. රු'000 . …………………………

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බස්නාහිර
Department of Education Western Province Department of Education Western Province Department of Education Wester Province Depart

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Department of Education - Western Province**

| 33 | S | II |
|---|---|---|

# අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය - 2024
# Support Test Paper for G.C.E (A/L)- 2024

ශ්‍රේණිය Grade } 13 | විෂයය Subject } ගිණුම්කරණය | පත්‍රය Paper } II | පැය Hours } පැය තුනයි

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි. අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානයට කර ගැනීමටත් යොදා ගන්න.

වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ

උපදෙස් :

පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- අදාළ පෙරවැඩ පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 200 ක් හිමි වේ.

1. සීමා සහිත බිතුම් පොදු සමාගම එකතු කළ අගය මත (VAT) සඳහා ලියාපදිංචි සමාගමකි. 2024.03.31 දිනට එහි සාරාංශගත ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ | 34 000 | |
| ගැනුම් / විකුණුම් | 23 600 | 41 400 |
| බෙදාහැරීමේ වියදම් | 4 000 | |
| පරිපාලන වියදම් | 5 000 | |
| වෙනත් වියදම් | 1 000 | |
| මූල්‍ය වියදම් | 800 | |
| තොගය (2023.04.01) | 2 100 | |
| ප්‍රත්‍යාගණන සංචිත - ඉඩම | | 2 000 |
| භාවිත අයිතිය ඇති වත්කම් - යන්ත්‍ර | 6 000 | |
| කල්බදු වගකීම් ණයහිමි | | 4 000 |
| වෙනත් ආදායම් | | 280 |
| ලාභාංශ | 500 | |
| ආදායම් බදු ප්‍රතිපාදන (2023.04.01) | | 500 |
| කල්බදු පොලී | 1 000 | |
| සේවක වන්දි ප්‍රතිපාදන | | 1100 |
| ආදායම් බදු ගෙවීම | 1 700 | |
| වගකීම් සහතික ප්‍රතිපාදන (2023.04.01) | | 800 |
| වෙළඳ ලැබිය යුතු දෑ / වෙළඳ ගෙවිය යුතු දෑ | 4 150 | 2 500 |
| ඉදිරියට කළ වියදම් | 800 | |
| ලැබිය යුතු ආදායම් | 200 | |
| මුදල් | 1 830 | |
| භාණ්ඩාගාර බිල්පත් (ත්‍රෛමාසික) | 900 | |
| පොදු සංචිත | | 1 400 |
| රඳවාගත් ඉපයුම | | 3 600 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු.20/- සාමාන්‍ය කොටස්) | | 30 000 |
| | **87 580** | **87 580** |

[දෙවන පිටුව බලන්න.]

**අතිරේක තොරතුරු :**

2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත ගැලපීම් සිදුකළ යුතුය.

(i) 2024.03.31 දිනට තොගයේ පිරිවැය රු.2 500 000 ක් වන අතර, මෙම තොගය තුළ රු.500 000 හානි වූ තොගයක් අඩංගු වේ. 2024.05.30 දින මෙම හානි වූ තොගය රු.90 000 නිම කිරීමේ වියදම් හා රු.60 000 ක විකුණුම් වියදම් දරා රු.550 000 කට විකුණා ඇත.

(ii) 2024.03.31 දිනට දේපළ පිරියත හා උපකරණ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වත්කම | පිරිවැය /ප්‍රත්‍යා. අගය | ධාරණ අගය | සුන්බුන් අගය | ඵලදායී ජීවකාලය |
|---|---|---|---|---|
| ඉඩම | 20 000 | 20 000 | - | අසීමිතයි |
| ගොඩනැගිලි | 15 000 | 11 000 | 2 000 | 13 |
| මෝටර් රථ | 5 000 | 3 000 | 500 | 9 |
| | 40 000 | **34 000** | | |

- ❖ 2023.04.01 දින ඉඩම ප්‍රථම වතාවට ප්‍රත්‍යාගණනය කර ඇති අතර, එය නිවැරදිව ගිණුම්ගත කර ඇත.
- ❖ 2023.04.01 දින මෝටර් රථයට රු.1 200 000 ක් වැය කර නව එන්ජිමක් සවි කරන ලදී. මෙය හේතුවෙන් ඵලදායී ජීවකාලය වසර 04 කින් වැඩි වේ. සුන්බුන් අගය රු.200 000 කින් වැඩි වේ. නවීකරණ වියදම් බෙදාහැරීමේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම හැර කිසිදු සටහනක් සිදු කර නොමැත.
- ❖ 2024.03.31 ගොඩනැගිලි දෙවන වර රු.12 000 000 කට ප්‍රත්‍යාගණනය කර ඇත. 2020/2021 වර්ෂයේ ප්‍රත්‍යාගණන ඌනතාවය රු.400 000 කි. මෙම ගනුදෙනුව පිළිබඳව කිසිදු සටහනක් සිදුකර නොමැත.
- ❖ 2024.03.31 දින පිරිවැය රු.1 500 000 හා එදිනට ධාරණ අගය රු.1 000 000 ක් වූ ලී බඩු රු.900 000 විකුණා ඇත. විකිණීමේ ලාභය හෝ අලාභය පරිපාලන වියදම් ලෙස දක්වා ඇත. ලී බඩු විකිණීම නිවැරදිව ගිණුම්ගත කර ඇත. ඵලදායී ජීව කාලය වසර 05 කි.
- ❖ දේපළ පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

(iii) 2023.10.01 සමාගම විසින් භාණ්ඩ විකිණීමේ හා විකිණීමෙන් පසු මාස 06 ක සේවා සැපයීම සඳහා වෙළඳ ගිවිසුමකට ගනුදෙනුකරු සමඟ එළඹෙයි. 2023.11.30 ගනුදෙනුකරුගෙන් ගිවිසුමට අදාළ මුළු ප්‍රතිඡ්ඨාව වශයෙන් රු.1 400 000 සමාගමට ලැබුණි. මෙම මුදල සමාගම විසින් විකුණුම් ලෙස ගිණුම්ගත කර ඇත. 2024.02.01 දින සමාගම විසින් ගනුදෙනුකරුට රු.800 000 ක සියලු භාණ්ඩ භාර දෙන ලදී. මේ පිළිබඳ වෙන කිසිදු සටහනක් සිදු කර නොමැත.

(iv) 2023.04.01 දිනට භාවිත අයිතිය ඇති වත්කම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | රු.'000 |
|---|---|
| යන්ත්‍ර පිරිවැය …………………………… | 10 000 |
| සමුච්චිත ක්ෂය ……………………………… | (4 000) |
| ධාරණ අගය……………………………….... | 6 000 |

කල්බදු කාලය වසර 05 ක් වන අතර, ඵලදායී ජීව කාලය වසර 08 කි. කල්බදු කාලය අවසානයේ භාවිත අයිතිය ඇති වත්කමේ අයිතිය ගැනුම්කරුට හිමි නොවේ. 2023/2024 හා 2024/2025 වර්ෂ සඳහා කල්බදු පොලී පිළිවෙලින් රු.400 000 ක් හා රු.340 000 වේ. 2023/2024 වර්ෂය සඳහා ගෙවූ කල්බදු වාරිකය කල්බදු පොලී ලෙස සටහන් කිරීම හැර වෙනත් කිසිදු සටහනක් කර නොමැත.

(v) 2022.02.03 දින සේවයෙන් පහ කරන ලද සේවකයෙකු රු.1 500 000 ඉල්ලා සමාගමට විරුද්ධව නඩුවක් පවරා ඇත. 2024.3.31 දිනට සමාගමේ නීතිඥයා විසින් ප්‍රතිපාදනය කරන ලද සේවක වන්දිය ශේෂ පිරික්සුමේ දක්වා ඇත. 2024.05.15 දින රු.900 000 ක් සමාගම විසින් සේවක වන්දි ලෙස ගෙවිය යුතු බවට අධිකරණය විසින් නියෝග කරන ලදී. එදිනම එම මුදල සමාගම විසින් ගෙවා දමන ලදී. මේ පිළිබඳ වෙනත් කිසිදු සටහනක් සිදු කර නොමැත.

(vi) 2022/2023 වර්ෂය සඳහා ගෙවූ ආදායම් බදු රු.600 000 ගෙවූ ආදායම් බදු තුළ අඩංගු වේ. 2023/2024 තක්සේරු වර්ෂයේ වාර්ෂික ආදායම් බදු වගකීම රු.1 800 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(vii) සමාගම භාණ්ඩ අලෙවි කරන විට වසර 02 ක කාලයක් සඳහා වගකීම් සහතික නිකුත් කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ. 2022/2023 වර්ෂය සඳහා වගකීම් සහතික ප්‍රතිපාදන වෙනුවෙන් ගෙවූ මුදල රු.400 000 කි. මෙම මුදල පරිපාලන වියදම් ලෙස සටහන් කර ඇත. 2022/2023 වසර වල වගකීම් සහතික ප්‍රතිපාදන වලින් රු.200 000,

2024/2025 වසරවලට අදාළ වේ. 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වගකීම් සහතික ප්‍රතිපාදන ලෙස රු.850 000 ක් වෙතැයි විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කර ඇත.

(viii) 2024.03.31 දින සිට වෙළඳ ලැබිය යුතු දෑ රු.150 000 ක ශේෂයක් බුන්වත් වී ඇති බව අධිකරණය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. ඉතිරි ශේෂය මත 10% වෙළඳ ලැබිය යුතු දෑ හානිකර අලාභ සඳහා ඉඩ හැරිය යුතු ය.

(ix) අධ්‍යක්ෂක මණ්ඩලය මූල්‍ය ප්‍රකාශ අනුමත කරන දිනය 2024.06.30 දින වේ.

(x) අධ්‍යක්ෂක මණ්ඩලය 2024.03.31 න් අවසන් වර්ෂය සඳහා පහත යෝජනා ඉදිරිපත් කරන ලදී.
1. පොදු සංචිතයට රු.300 000 ක් මාරු කිරීම.
2. සෑම සාමාන්‍ය කොටසකට රු.2/- බැගින් අවසාන ලාභාංශයක් යෝජනා කිරීම.

**අවශ්‍ය වන්නේ,**

LKAS 01 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතියට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත බිතුම් පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන. (සටහන් ද ඇතුලුව)

1. 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය.
2. 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය.
3. 2024.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.

**(මුළු ලකුණු 40 යි.)**

2. (අ) නිෂ්පාදන ආයතනයක මූලික යෙදවුම ලෙස සලකන ''Z''නමැති අමුද්‍රව්‍ය ඒකකයට අදාළව පහත තොරතුරු ඔබට සපයා ඇත.

- ගබඩාවෙන් නිකුත් කරන අමුද්‍රව්‍ය මිල කිරීම ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් (FIFO) ක්‍රමයට සිදු කෙරේ.
- ''Z'' අමුද්‍රව්‍යයේ ආර්ථික ඇණවුම් ප්‍රමාණය ඒකක 1 500 කි.
- ''Z'' අමුද්‍රව්‍යයේ යළි ඇණවුම් කාලය නිශ්චිතවම දින 5 කි.
- ආයතනයේ නිෂ්පාදන කම්හල තුළ 2024.05.01 දිනට ගබඩාවෙන් නිකුත් කළ රු.7 000 ක් වටිනා තොගයක් ඉතිරිව තිබූ අතර, එහි අමුද්‍රව්‍ය ඒකක 200 ක් ඇතුළත් විය. තවද 2024.05.31 දිනට පාවිච්චි නොකළ අමුද්‍රව්‍ය ඒකක 300 ක් කම්හල තුළ පැවතුණි.
- 2024 මැයි මාසය තුළ ''Z'' අමුද්‍රව්‍යයට අදාළව ගබඩාභාරකරුගේ වාර්තාවලට අනුව පහත තොරතුරු ඉදිරිපත් කර ඇත.

| දිනය | විස්තරය | ප්‍රමාණය | ඒකකයක මිල (රු.) |
|---|---|---|---|
| 5/1 | ශේෂය | 800 | 35 |
| 5/6 | ලැබීම් | ? | 40 |
| 5/7 | නිකුත් කිරීම් | 600 | ? |
| 5/12 | නිකුත් කිරීම් | 900 | ? |
| 5/17 | ලැබීම් | ? | 42 |
| 5/20 | නිකුත් කිරීම් | 600 | ? |
| 5/23 | නිකුත් කිරීම් | 700 | ? |
| 5/25 | නිකුත් කිරීම් | 200 | ? |
| 5/30 | ලැබීම් | ? | 45 |
| 5/31 | නිකුත් කිරීම් | 700 | ? |

**අවශ්‍ය වන්නේ,**

1. ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ (FIFO) ක්‍රමයට ගබඩා ලෙජරය පිළියෙල කිරීම.
2. 2024.05..31 දිනට ''Z'' අමුද්‍රව්‍යයේ ගබඩාවේ ඉතිරි තොගයේ පිරිවැය
3. ''Z'' අමුද්‍රව්‍යයට අදාළ යළි ඇණවුම් මට්ටම
4. 2024 මැයි මාසයේ කම්හලේ පරිභෝජනය කළ අමුද්‍රව්‍ය පිරිවැය දැක්වෙන ප්‍රකාශනය.

**(ලකුණු 12 යි.)**

[හතර වන පිටුව බලන්න.]

2. (ආ)සීමිත අරුන්දතී සමාගම නිෂ්පාදන යන්ත්‍ර දෙකක් ඇසුරින් තම නිෂ්පාදන ක්‍රියාවලිය මෙහෙයවන අතර, පළමු යන්ත්‍රය මගින් සැකසුම් කටයුතු සිදු කරන අතර, දෙවන යන්ත්‍රය නිමකිරීම හා ඇසුරුම් කටයුතු සිදු කරනු ලබයි. තවද නඩත්තු හා අනෙකුත් සේවා සැපයීම සඳහා වෙනම අංශයක් ද පවතී.

❖ 2025 වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත පොදුකාර්ය වියදම් පහත වේ.

| | රු.'000 |
|---|---|
| විදුලිය වියදම් යන්ත්‍ර I සඳහා | 160 |
| II සඳහා | 200 |
| ආරක්ෂක සේවා වියදම් | 270 |
| යන්ත්‍ර ක්ෂය | 1 400 |
| ගොඩනැඟිලි කුලී - සේවා අංශය | 100 |
| විදුලි වියදම් - ආලෝකය සඳහා | 360 |
| යන්ත්‍ර රක්ෂණය | 700 |
| සුභසාධන වියදම් | 350 |
| වක්‍ර ශ්‍රමය - යන්ත්‍ර I | 260 |
| යන්ත්‍ර II | 340 |
| සේවා අංශය | 80 |
| යන්ත්‍ර අලුත්වැඩියා වියදම් | 280 |

❖ සුභසාධන වියදම් ආයතනයේ සියලුම සේවකයන්ට අදාළ වේ.

❖ නිෂ්පාදනය කරන භාණ්ඩ වර්ග දෙකක් ඇති අතර ඊට අදාළව පහත ඇස්තමේන්තු සපයා ඇත.

| | පළමු වර්ගය (P) | දෙවන වර්ගය (Q) |
|---|---|---|
| ඒකකයක - සෘජු ද්‍රව්‍ය | 165 | 200 |
| - සෘජු ශ්‍රමය | 235 | 180 |
| - සෘජු වෙනත් | 105 | 30 |
| ඒකකයට අවශ්‍ය - යන්ත්‍ර පැය | 2 | 4 |
| - ශ්‍රම පැය | 3 | 2 |

**අතිරේක තොරතුරු :**

(1)

| අයිතමය | යන්ත්‍ර I | යන්ත්‍ර II | සේවා අංශය |
|---|---|---|---|
| යන්ත්‍ර පිරිවැය (රු.'000) | 4 500 | 2 500 | - |
| ආරක්ෂක සේවකයන් ගණන | 7 | 11 | - |
| අනෙකුත් සේවකයන් | 21 | 17 | 14 |
| භූමි ප්‍රමාණය - $m^2$ | 1 200 | 1 200 | 600 |
| යන්ත්‍ර පැය | 6 000 | 12 500 | - |
| ශ්‍රම පැය | 20 000 | 4 000 | - |

(2) සේවා අංශයේ පොදුකාර්ය පිරිවැය යන්ත්‍ර I සහ යන්ත්‍ර II අතර සමානව බෙදාහැරිය යුතුය.

(3) යන්ත්‍ර I හි පොදුකාර්ය පිරිවැය ශ්‍රම පැය පදනම මතත්, යන්ත්‍ර II හි පොදුකාර්ය පිරිවැය යන්ත්‍ර පැය පදනම මතත් අන්තර්ග්‍රහණය කරනු ලබයි.

(4) පළමු වර්ගයේ (P) ඒකකයක විකුණුම් මිල තීරණය කරනු ලබන්නේ විකුණුම් මිලට 33 1/3% ක ලාභාන්තිකයක් එකතු කිරීමෙනි. තවද, දෙවන වර්ගයේ (Q) ඒකකයක විකුණුම් මිල පිරිවැයට 40% ක ලාභාන්තිකයක් එකතු කර තීරණය කරයි.

**අවශ්‍ය වන්නේ,**

1. සේවා අංශයේ පොදුකාර්ය පිරිවැය නැවත විභජනය ද සහිතව පොදුකාර්ය පිරිවැය විභජන පත්‍රිකාව. (විභජන පදනම සහිතව)
2. එක් එක් පිරිවැය මධ්‍යස්ථාන සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත.
3. පළමු වර්ගයේ (P) සහ දෙවන වර්ගයේ (Q) නිෂ්පාදනවල විකුණුම් මිල ගණනය කිරීම. **(ලකුණු 28 යි.)**

**(මුළු ලකුණු 40 යි.)**

[පස් වන පිටුව බලන්න.]

3. (අ) ලිසුම් එන්ටප්‍රයිසස් ආයතනය ක්‍රීඩා භාණ්ඩ අලෙවිකරණ ඒක පුද්ගල ව්‍යාපාරයකි. 2024 ජනවාරි 01 දිනට ව්‍යාපාරයේ ආරම්භක ශේෂයන් පහත වේ.

| | රු.'000 |
|---|---|
| දේපළ, පිරියත හා උපකරණ | 4 800 |
| තොගය | 240 |
| වෙළඳ ලැබිය යුතු දෑ (ධාරණ අගය) | 900 |
| ඉදිරියට ගෙවූ වියදම් | 160 |
| වෙනත් ලැබිය යුතු දෑ | 300 |
| දිගුකාලීන ණය | 1 500 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 420 |
| ලද අත්තිකාරම් | 80 |
| බැංකුවේ ඇති මුදල් | 600 |

2024 ජනවාරි මාසය තුළ සිදුවූ ගනුදෙනු පහතින් දක්වා ඇත.

(i) පිරිවැය රු.360 000 ක්වූ ක්‍රීඩා භාණ්ඩ මිලටගත් අතර, ඒ සඳහා චෙක්පත් නිකුත් කරන ලදී.

(ii) ජනවාරි 01 දිනට වෙළඳ ලැබිය යුතු දෑ ශේෂය මත 10% ක් හානිකරණ අලාභ සඳහා ඉඩ හැර ධාරණ අගය ගණනය කර ඇති අතර දළ ශේෂයෙන් 50% ක් පියවීම සඳහා රු.460 000 ක චෙක් පතක් ලැබුණි.

(iii) පිරිවැය රු.160 000 ක් වූ ක්‍රීඩා භාණ්ඩ තොගයක් රු.280 000 කට අත්පිට විකුණන ලදී.

(iv) දිගුකාලීන ණය සඳහා රු.125 000 ක ණයවාරිකයක් චෙක්පතකින් ගෙවූ අතර, එහි අන්තර්ගත පොලී වියදම රු.35 000 කි.

(v) ලද අත්තිකාරම් ලෙස දක්වා ඇත්තේ 2024 ජනවාරි මස ක්‍රීඩා උපකරණ සැපයීමක් සඳහා ගනුදෙනුකරුවෙකු සමඟ ඇතිකර ගත් ගිවිසුමක් වෙනුවෙන් 2023 දෙසැම්බර් මාසයේ දී ලද මුදලයි. ඊට අදාළව පිරිවැය රු.120 000 ක්වූ ක්‍රීඩා භාණ්ඩ තොගයක් රු.240 000 ක ඉන්වොයිස් මිලකට ගනුදෙනුකරු වෙත ජනවාරි 12 වෙනි දින යවා ඇත. ඉන්වොයිස් මිල මත 10% ක වෙළඳ වට්ටමක් ලබා දී ඇති අතර, ගනුදෙනුකරු හිඟ මුදල තිසි පරිදි එදින ම පියවා ඇත.

(vi) 2023 දෙසැම්බර් මාසයේ දී 2024 වර්ෂයේ පළමු මාස 04 සඳහා ගෙවන ලද කඩ කුලිය ඉදිරියට ගෙවූ වියදම් ශේෂයෙන් දක්වා ඇත.

(vii) ආයතනයේ සේවකයාට ලබා දී ඇති ණය මුදලක් 2024 ජනවාරි 01 දිනට වෙනත් ලැබිය යුතු දෑ ශේෂයෙන් නිරූපණය වේ. ඉන් 5% ක් සෑම මසකම 15 වන දින රු.10 000 ක පොලියක් සමඟ සේවකයාගේ වැටුපෙන් අය කර ගෙන මාසික වැටුප් ගෙවනු ලබයි. ජනවාරි මස ගෙවන ලද සේවක ශුද්ධ වැටුප රු.45 000 කි. සේවක වැටුපෙන් වෙනත් අඩු කිරීම් නොමැත.

(viii) අයිතිකරුගේ පුද්ගලික වාහනයේ නඩත්තු වියදම් වෙනුවෙන් ව්‍යාපාරයේ ජංගම ගිණුමෙන් ලියා නිකුත් කළ චෙක්පතේ වටිනාකම රු.22 000 කි.

(ix) ව්‍යාපාරයේ ණයහිමියන් ට ගෙවිය යුතු රු.300 000 ක් 10% ක මුදල් වට්ටමකට යටත්ව පියවන ලදී.

(x) පිරිවැය රු.125 000 ක් වූ තොගයක් ජනවාරි 20 දින රු.235 000 කට ණයට විකුණන ලදී.

(xi) ජනවාරි මස අනෙකුත් මෙහෙයුම් වියදම් සඳහා රු.34 000 ක චෙක්පතක් නිකුත් කරන ලදී.

(xii) ජනවාරි 20 දින විකුණන ලද ක්‍රීඩා භාණ්ඩ තොගයෙන් පිරිවැය රු.15 000 ක් සහ විකුණුම් මිල රු.25 000 ක් වූ ක්‍රීඩා භාණ්ඩ ආපසු හරවා එවා ඇත.

**අතිරේක තොරතුරු :**

1. ජනවාරි 31 දිනට ලද බැංකු ප්‍රකාශනය තුළ අන්තර්ගත බැංකු ගාස්තු රු.3 000 ක් වන අතර, ස්ථාවර නියෝග මත ගෙවා ඇති රක්ෂණ ගාස්තුව රු.7 000 කි.
2. ජනවාරි මාසය සඳහා දේපළ පිරියත හා උපකරණ ක්ෂය රු.40 000 කි.
3. ජනවාරි 31 දිනට වෙළඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීම 10% ක් විය යුතුය.
4. 2024 ජනවාරි 31 දිනට උපචිත මෙහෙයුම් වියදම් රු.16 000 කි.

**අවශ්‍ය වන්නේ,**

